www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළේ ව්‍යසනය

**Devastation on the east coast of Sri Lanka**

**එම්. අරවින්දන් සහ සරත් කුමාර විසින්**
**එහි සිට වාර්තා කරයි.**
**2005 ජනවාරි 06**

ශ්‍රී ලංකාවේ ගිනිකොන දිග වෙරලබඩ අම්පාර දිස්ත්‍රික්කය, දෙසැම්බර් 26 සුනාමි රල පහරට මුහුන ලා පිහිටි එහි ප්‍රථම ප්‍රහාරයට මුහුන පෑ දිස්ත්‍රික්කය යි. යෝධ සාගර තරංග වෙරලබඩ පහත් බිම් පිසදා ගමන් ගත්තේ කිසිදු පූර්ව අනතුරු ඇඟවීමක් නො තිබුනු තත්වය තුල මිනිසුන් බිලි ගනිමින් හා ගොඩනැගිලි බිමට සමතලා කරමිනි. විසි අවුරුදු සිවිල් යුද්ධයෙන් ඒ වන විටත් දැදුරු වී ගොස් තිබූ එම දිස්ත්‍රික්කය අලුත් නස්පැත්තියකට මුහුන පෑවේ ය.

ආන්ඩුව මියගිය සංඛ්‍යාව 13,703ක් යයි ප්‍රකාශ කරන අතර සැබෑ සංඛ්‍යාව එමෙන් දෙගුනයක් තරම් විශාල විය හැකි ය. ප්‍රාදේශීය ලේකම්වරුන් කිහිප දෙනෙක් ද ඇතුලුව අප හා කතා කල අයගේ ගනන් බැලීම් අනුව මිය ගිය සංඛ්‍යාව ආසන්න වසයෙන් 25,000ක් හා 2500කට වැඩි ගනනක් තවමත් අතුරුදන්ව සිටින බව යි. එම බිහිසුනු ඛේදවාචකයෙන් 512,000ක් වන ජනගහනයෙන් සියයට 5ක් හෝ විස්සෙන් එකක් මරනයට පත්ව ඇත.

තවත් බොහෝ දෙනෙක් ආහාර, පිරිසිදු ජලය හා වෛද්‍ය පහසුකම් ද නිවාස ද අහිමිව සිටිති. අම්පාර දිස්ත්‍රික්කයේ පමනක් 80,000කට වැඩි සංඛ්‍යාවක් සරනාගත කඳවුරු 100කට ආසන්න සංඛ්‍යාවක නවාතැන් ගෙන සිටිති. මෙම ව්‍යසනයෙන් අවම වසයෙන් 166,000ක් දෙනා විනාශයට මුහුන පා සිටින අතර එය දිස්ත්‍රික්කයේ ජනගහනයෙන් තුනෙන් එකකි.

සුනාමියත් සමගම පැමිනි මෝසම් වර්ෂාවන් නැගෙනහිර වෙරලබඩ ප්‍රදේශයේ මාර්ග ජලයෙන් යටවූ අතර දහස් ගනන් ජනතාව ඉන් පීඩාවට පත් විය. මෙම දිස්ත්‍රික්කයම හමුදා පාලන ප්‍රදේශ හා දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයේ (එල්ටීටීඊ) පාලනය යටතේ පවතින ප්‍රදේශ වසයෙන් බෙදී ඇත. දිස්ත්‍රික්කය තුල සිදුවූ විනාශයේ පරිමාව හා මිය ගිය සංඛ්‍යාව ගනනය කිරීමට සති ගනනක් ගත වනු ඇත.

*ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* (*ලෝසවෙඅ*) වාර්තාකරුවන් කොලඹින් පිටත් වූයේ සුනාමියේ කඩා වැදීමෙන් දෙදිනකට පසු දෙසැම්බර් 28 දා ය. කොලඹ-මහනුවර-අම්පාර ප්‍රධාන මාර්ගය දිගේ දිවයිනේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශ බලා වැල නොකැඩී ඇදෙන ලොරි ඇතුලු වාහන අප දැක ගත හැකි විය. ව්‍යසනයට ගොදුරු වූවන්ට උපකාර කිරීම සඳහා සාපේක්ෂ වසයෙන් සුනාමියේ බලපෑමට හසු නොවූ රටෙහි බටහිර, වයඹ, හා මධ්‍යම ප්‍රදේශවල සිට ජනතාව එම ප්‍රදේශ කරා ඇදෙමින් සිටිති.

නැගෙනහිරට ගමන්ගන්නා පිරිස් අතර ගැහැනු පිරිමි හා තරුන කොටස් වූ අතර ඔවුන් උදලු, සවල ඇතුලු උපකරන රැගෙන යමින් සිටියහ. තමන් ම සංවිධානය වෙමින් ඔවුන් ගමන් ගත්තේ සුන් බුන් ඉවත් කිරීමට, නිවාස පිරිසිදු කිරීමට හා ජනතාව තමන්ගේ දෙපයින් යලි නගා සිටුවීම සඳහා ය. මේ වනවිට ආන්ඩුව හෝ දිස්ත්‍රික් පරිපාලනය පුනරුත්ථාපනය ගැන සිතා බැලීමක් වත් කර නො තිබුනි. සිරස රූපවාහිනියෙන් නිවේදනය කරන ලද ආයාචනයකට ප්‍රතිචාර දක්වමින් කන්ඩායම් ගනනාවක් ම විපතට පත් වූවන්ට සහන සැලැස්වීම සඳහා මග දිගට බඩුබාහිරාදිය රැස් කරමින් සිටියහ.

වඩාත් සැලකිය යුතු කාරනය වූයේ නැගෙනහිර දෙසට එමින් සිටි බහුතරයක් දෙනා දෙමල හා මුස්ලිම්වරුන්ට උපකාර කිරීමට ඉදිරිපත් වූ සිංහලයන් වීම යි. දශක ගනනාවක් පුරා රටේ පාලක පන්තිය ව්‍යසනකාරී විපාක අත් කර දුන් වාර්ගික එදිරිවාදීකම් අවුස්සා ඇත. මෙම අර්බුදය ඉක්මනින්ම අනාවරනය කර ඇත්තේ භාෂාව හා ආගමික වෙනස්කම් කුමක් වුවද තමන් මුහුන දෙන්නේ එක හා සමාන ගැටලුවලට බව සාමාන්‍ය වැඩ කරන ජනතාවට හඳුනාගැනීමට හැකි වීමයි.

කඩවත දී නිදහස් වෙලඳ කලාපයක තරුනියන් තිදෙනෙක්, නැගෙනහිර බලා යන වාහන පෙලකට සහනාධාර සහිත බඩු මිටියක් බාර දුන්හ. මසකට රුපියල් 5,000ක් (ඇමරිකානු ඩොලර් 50) පමන වැටුපක් ලබන මොවුන් විපතට පත් වූවන්ට යයි උපකාරයක් හෝ කිරීම තම යුතුකම සේ සැලකූ බව පෙනී ගියේය.

ආධාර බෙදීමේ නිරත වී සිටි මීරිගම ප්‍රදේශයේ අනුර කුමාර නමැති තරුනයා අපට මෙසේ කීවේ ය: ‘‘විපතට පත් වුනේ දෙමල අය ද මුස්ලිම් අය ද යන්න අපිට ප්‍රශ්නයක් නොවේ. සැබැවටම ඔවුන් අසරනයි. එය ඛේදජනකයි, ජාතිවාදී කියාපෑම්වලට තැනක් නැහැ. සියලුම මිනිසුන්ගේ කඳුලු හා ලේ එක වගෙයි - හැම ලේ ම රතුයි.’’

අම්පාර බන්ඩාරනායක බාලිකා විද්‍යාලයේ සරනාගත කඳවුරේ දී අපට කතා කල රෝහන හා මහින්ද කීවේ: ‘‘අති විශාල ජනකායක් එක වරටම

අසරන භාවයට පත් කරනු ලැබ තිබෙනවා. මෙවැනි කාලයකදී වර්ගය හෝ වාර්ගිකත්වය පිලිබඳ කල්පනා කිරීමට ඉඩක් නැහැ. අපි සියලුදෙනාම මනුෂ්‍යයෝ.''

## අම්පාරේ දී

අම්පාර දිස්ත්‍රික්කය සිංහල, දෙමල හා මුස්ලිම් ජනතාවගෙන් යුක්ත ය. වඩාත් ම බලපෑමට ලක් වූයේ වෙරලාසන්නයේ ජීවත්වන දෙමල හා මුස්ලිම් කොටස් ය. බොහෝමයක් ධීවර පවුල් වෙති. වෙරලබඩ ප්‍රදේශයේ වැඩි කොටසක් රලට හසු වී ගසාගෙන ගොස් ය. මුහුදේ සිට මීටර 100ක් දුරක කිසිවක් ඉතිරි වූයේ නැත. මීටර් 10ක් තරම් උසට නැගි රල පහරින් නිවාස බොහොමයක් බිමට සමතලා වී ඇත. ප්‍රදේශවාසීහු විස්තර කලේ රැල්ල පොල් ගස් තරම් උසට නැගී ආ බවයි. සමහර ස්ථානවල කිලෝමීටර් 3ක් තරම් රට තුලට ජලය ගලා ගියේ ය.

සෑම තැනකම දර්ශනය ඒකාකාරී විය. නිවාස, රෝහල්, හින්දු පන්සල් සහ අනෙකුත් ගොඩනැගිලි එක ම ඉරනමට මුහුන දුන්නේ ය. ගස් ඉදිරී වැටී ඇති අතර කාර්, වෑන් හා බස් රථ තැලී පොඩිවී ගොස් ය. රූපවාහිනී, ශීතකරන, බයිසිකල්, උයන උදුන්, හා අනෙකුත් ගෘහභාන්ඩවල සුන්බුන් සෑම තැනකම විසිරී ඇත. ධීවර බෝට්ටුවක් කිලෝමීටර 2ක් රට තුලට ගසාගෙන ගොස් තිබුනු අතර තවත් කිලෝමීටර 2ක් ඇතුලට ද විපතේ සාක්ෂි  දැක ගත හැකි විය.

කල්මුනේට ද දැඩි අලාභහානි සිදුවී ඇත. මුහුදේ සිට කිලෝමීටරයක් දක්වා වූ ප්‍රදේශයේ සියලුම ගොඩනැගිලි විනාශ වී ගොසිනි. එය දරුනු කාපට් බෝම්බ ප්‍රහාරයකට ලක්වූ ප්‍රදේශයක් වැනි ය.

මීට පෙර අධික ජනගහනයක් සහිත ප්‍රදේශයක් වූ කරෙයිතිවු හි මුලු ප්‍රදේශයම බිමට සමතලා වී ඇත. පලමු මීටර 50 තුල කැඩුනු බිත්තියක් වත් දැක ගත නොහැක. ඇත්තේ සුන්බුන් පමනි. කි.මී. බාගයක් රට තුලට වන්නට පිහිටි කරයිතිවු මධ්‍ය මහා විද්‍යාලයේ ගොඩනැගිලිවල පලමු මහලට ජලය ගලා ඇත. පාසල ඉදිරිපිට මීටරයකට වඩා ගැඹුරු විශාල කානුවක් හෑරී තිබුනි.

වෙරලාසන්නයේ පිහිටි කරෙයිතිවු රෝහලටද දැඩිලෙස අලාභ හානි සිදු විය. රෝගීන් 25 දෙනාම ද එක් හෙදියක් ද මරනයට පත්ව ඇත. රෝහලේ ඉතිරි සේවකයින් පන බේරා ගෙන ඇත. වෛද්‍යවරයා ගසාගෙන යද්දී ගසක අත්තක් අල්ලා ගැනීමට සමත් විය.

දෙසැම්බර් 29 දා වෙරල දිගේ ගමන් ගනිද්දී කරෙයිතිවු සිට මරුතමුනෙයි දක්වා අනාථ කඳවුරු 20ක් අපි ගනන් කලෙමු. ප්‍රධාන පාරට දුරින් තවත් කඳවුරු තිබුනි. ජනතාවට නවාතැන් ගත හැකි සෑම පාසලක්, මුස්ලිම් පල්ලියක්, කතෝලික පල්ලියක් හා පන්සලක් ම සරනාගත කඳවුරක් බවට පත්ව තිබුනි. එහෙත් බොහෝ ස්ථානවල එක් ආන්ඩුවේ නිලධාරියෙක්වත් දැක ගැනීමට නොලැබුනි.

කාර්මිකයෙකු වන සිවකුමාර් මෙසේ කීවේ ය: ''අනාථ කඳවුර පවත්වාගෙන යන්නේ සිංහල ජනතාව විසින්. ඔවුන් අපිට හොඳින් සලකනවා. අපිට තව මත් රජයෙන් උදව්වක් ලැබී නැහැ. විශේෂයෙන් ම මම සිංහල ජනතාවට ස්තුති කිරීමට කැමතියි. යුද්ධය නිසා අපට වැරදි වැටහීමක් තිබුනා. දැන් අපි බොහෝ දේ වෙනස් වී ඇති බව දන්නවා. මම ඇඳගෙන ඉන්න ඇඳුම් දුන්නේ මාත් එක්ක රජයේ ප්‍රවාහන ඩිපෝවේ වැඩ කල සිංහල කාන්තාවක්.''

දෙසැම්බර් 26 දා සියලු පවුල් අතුගා දමනු ලැබින. 31 හැවිරිදි කෝකියෙකු වන කලිෆ් ඩීන් ට තම පවුලේ සාමාජිකයන් 7 දෙනෙක් අහිමි විය. ඔහුගේ බිරිඳ, නැන්දනිය, මාමා හා දරුවන් හතර දෙනා මිය ගියහ. බේරුනේ ඔහුගේ දියනිය පමනි. 50 හැවිරිදි ආරක්ෂක නිලධාරියකු වන මොහොමඩ් අලි ප්‍රකාශ කලේ ඔහුගේ ඥාතීන් 23 දෙනෙක් මිය ගිය බව යි.

සනීපාරක්ෂාව ප්‍රධාන ගැටලුවක් විය. දෙසැම්බර් 29 දින පවා මල සිරුරු විශාල ප්‍රමානයක් දැක ගත හැකි විය. ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වූ තරුනයන් මල සිරුරු වැලලීමෙහි නිරත වෙති. සමන්තුරේ හි පමනක් සිරුරු 4,000ක් පමන දෙසැම්බර් 28 දා වලලනු ලැබුනි.

හානියට පත් වූවන්ගෙන් බහුතරයක් දුගී ධීවරයෝ ය. ජීවත්වීම සඳහා ඔවුහු කුඩා බෝට්ටු හා තෙප්පම් වලින්  මසුන් මරති. මාලු ඇල්ලීමට නොහැකි කාලවලදී බොහෝ දෙනෙකුට වෙනත් රැකියා සොයා ගැනීමට සිදුව ඇත. සමහර දිනවල ඔවුහු රුපියල් 200 සිට 500 දක්වා උපයති: සමහර දිනවල සතයක් වත් නැත. මුහුද අසල පැල්පත්වල ජීවත්වෙනවා හැර ඔවුන්ට වෙනත් විකල්පයක් නැත.

දිවි බේරාගත් අය අනතුරු ඇඟවීමක් නොමැතිවීම පිලිබඳව කෝපයෙන් පසු වෙති. පූර්ව අත්දැකීමක් හෝ අවබෝධයක් නැති බොහෝ දෙනා විශේෂයෙන්ම ලමුන් සුනාමියට පෙර මුහුද පසුබැස ගිය විට එය පසුපස්සේ ගමන් ගත්හ. වෙරලේ සිටියවුන් දෙවනුව පැමිනි ඇවැන්ත මුහුදු තරංග දැක දුවන්නට පටන් ගත්හ. එක් වරම පැමිනි රල පහරට බාල, මහලු, රෝගී සහ තරුන කොටස් එක් වරටම ගිලගනු ලැබින.

විපත සැල වූ කිලෝමීටර් 20ක් රට තුලට වන්නට පිහිටි  අම්පාර නගරයේ ජනතාව ඉතිරිවූවන්ට උදවු කිරීම යුහුසුලු වූහ. ත්‍රී රෝද රථ, බස්, වෑන්, හා ලොරි, සහාය පිනිස වෙරල කරා ගමන් ගත්තේ ය.

තරුන ත්‍රිරෝද රථ රියැදුරෙකුවන සෙනෙවිරත්න කීවේ: ''මුහුද ගොඩ ගලමින් තිබෙන බව සමහරුන් අපට ඇනුම් දුන්නා. වේලාව ඉරිදා උදේ 9.30 යි. වහාම අපි වෙරලට යන විට එය සම්පූර්නයෙන්ම විනාශයට පත්ව තිබුනා. මගේ රථයේ බේරීගත් හය දෙනෙක් ආරක්ෂිත ස්ථානයකට රැගෙන ආවා. වාහන තිබුනු හැමදෙනාම එලෙස කරමින් සිටියා.''

## නිල නොතැකීම

ඊට වෙනස් ලෙස නිලධාරීන් ප්‍රතිචාර දැක්වූයේ

නිලධාරිවාදී උදාසීන හා අකාර්යක්ෂම ලෙස ය. පලමු රැල්ල කඩා වැදුනු පසුවත් කිසිදු ක්‍රියා මාර්ගයක් ගනු නො ලැබිනි.

දිස්ත්‍රික් ලේකම් හේරත් අබේවීර අපට ප්‍රකාශ කලේ විපත පිලිබඳව තමන් දැනගත්තේ උදේ 10.00 ට පමන බව යි. ඔහුගේ ප්‍රතිචාරය ගැන විමසූ විට ඔහු තරමක් ආරක්ෂාකාරීව ප්‍රකාශ කලේ: ''ඉරිදා දවස නිවාඩු දිනයක් බැවිනුත් නිලධාරීන් බොහොමයක් දුර බැහැර ප්‍රදේශවල අය නිසා ඔවුන් ගම් රටවලට ගොස් තිබුනු බැවිනුත් අපිට වැඩ ආරම්භ කල හැකි වූයේ සඳුදා (දෙසැ. 27) වන විට ය.''

තමන් කාලගුන විද්‍යා දෙපාර්තමේන්තුවට කතා කල විට දැන ගත් දේ අබේවීර මෙසේ විස්තර කලේ ය. ''යමක් සිදු වී තිබෙන බව ඔවුන් සනාථ කල ද එමගින් වැඩි බලපෑමක් ඇති නොවන බව ද මුහුදු ජලය රට තුලට ගලා ඒමේ හැකියාවක් තිබුන බව ද දන්වා සිටියා.''

ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග විසින් පිහිටුවන ලද ආපදා කලමනාකරන ඒකකයේ වැඩකටයුතු පිලිබඳව විමසූ විට එම ඒකකය ගංවතුර හා සුලිසුලං තත්වයන් සම්බන්ධ එකක් මිස මෙවන් අර්බුද සඳහා වූ එකක් නොවන බව පවසමින් අබේවීර එම ප්‍රශ්නය බැහැර කලේ ය.

නිල උදාසීනත්වය හා තොරතුරු මඳකම බිය හීතිකාව වැඩිකලා පමනි. ත්‍රී රෝද රථ රියැදුරු සෙනෙවිරත්නම් අපට කීවේ: ''මම අම්පාරට ලඟාවනවිට මගේ බිරිඳගෙන් දුර ඇමතුමක් ලැබුනා. ඇය බයවෙලා හිටියේ. මුහුදු රල අම්පාරටත් එනු ඇතැයි කටකතා පැතිරුනා. එබැවින් ආපසු ගොස් වඩාත් ආරක්ෂාකාරී ස්ථානයකට ඇය ඇරලවන්න සිදු නොවුනා නම් විපතට පත් වූ තවත් අය ආරක්ෂාකාරී ස්ථානවලට ගෙන යා හැකිව තිබුනා.''

අප දිසාපති කාර්යාලයේ සිටියදී ශක්ති රූපවාහිනියේ අලුත්ම ප්‍රවෘත්තියකින් කියවුනේ ඉන්දියාව තවත් සුනාමි තත්වයකට මුහුන පා ඇති බවත් එය පැයකට අඩු කාලයක් තුල නැගෙනහිර වෙරලට පැමිනිය හැකි බවත් ය. සෑම දෙනාම හීතියට පත් වූ අතර කුමක් කලයුතු දැයි කිසිවෙකුටත් අදහසක් නොවී ය. කාලගුන විද්‍යා දෙපාර්තමේන්තුව අමතා තර්ජනයක් නොමැති බව තහවුරු කර ගැනීමට පැය කාලකටත් වඩා ගත විය. එහෙත් ආන්ඩුවේ රූපවාහිනි දිවා ප්‍රවෘත්ති විකාශය හැර ඒ පිලිබඳව ජනතාවට දැන ගත හැකි වෙනත් ක්‍රමයක් නො වී ය.

සරනාගත කඳවුරු තුල පැවතියේ දරුනු ව්‍යාකූලත්වයකි. අප හඳුනන අනුර අපට කීවේ තවත් සුනාමි තත්වයක් පිලිබඳ ප්‍රවෘත්තිය ලැබෙන විට මඩකලපුව දිස්ත්‍රික්කයේ එරාවූර් කඳවුරේ 2,500ක් පමන සරනාගතයින් සිටි බව යි. ''සියලු දෙනාම බිය වී ඔවුන්ට සහන වසයෙන් ලැබී තිබූ දේවල් පවා අතහැර දුවන්නට පටන්ගත්තා. කොහාට දුවන්නේ දැයි පවා ඔවුන්ට වැටහීමක් තිබුනේ නැහැ. සමහරුන් කොහේ ගිහින් දැයි අපි තවම දන්නේ නැහැ.''

''ලමුන් බේරීගැනීමට දඟලනු මා දුටුවා. තුන් හැවිරිදි පිරිමි ලමයෙක් කටුකම්බි වැටක ඇමිනී සිටියා. ඔහුව එල්ලී සිටියේ කමිසෙන් හා කලිසමෙන්. ඔහු හයියෙන් අඬමින් සිටියා. වාසනාවට මට ඔහුව නිදහස් කර ගැනීමට හැකි වුනා." තොරතුරු සන්නිවේදනය නොමැතිකම පිලිබඳව අනුර කෝපයෙන් පසුවිය. "ග්‍රාම නිලධාරිවරයා සිටියත් ඔහුට දිස්ත්‍රික් පරිපාලනය සමග සන්නිවේදනය කල නොහැකියි. මෙය අනවශ්‍ය හා සාපරාධී තත්වයක්.''

දෙසැම්බර් 29 දා වන විට ද බොහෝ අනාථ කඳවුරුවලට රජයෙන් කිසිදු සහනාධාරයක් ලැබී නොතිබින - විශේෂයෙන්ම මඩකලපුව දිස්ත්‍රික්කය ආසන්නයේ පිහිටි කඳවුරුවලට - සහන සේවා සඳහා අවශ්‍යතරම් අරමුදල් ලබා දෙන බවට ආන්ඩුව ප්‍රසිද්ධියේ කියමින් සිටියත් දෙසැම්බර් 30 දා වන විටත් මුදල් ලැබී නැති බව ප්‍රාදේශීය ලේකම්වරුන් කිහිපදෙනෙක් අපට ප්‍රකාශ කලහ. ඔවුන්ට සතයක්වත් ලැබී නොතිබුනු අතර සිය පුද්ගලික මුදලින් ආධාර සපයමින් සිටිති.

සම්පත් හිගකම ගැන පැමිනිලි සෑම තැනකින් ම ගලා ආවේ ය. එක් ප්‍රාදේශීය ලේකම්වරයෙක් කීවේ සරනාගත කඳවුරුවලට ලබා දීම සඳහා තමන්ට අවම වසයෙන් වතුර ටැංකි 40ක් අවශ්‍යව තිබුනත් තිබෙන්නේ 5ක් පමනක් බව යි. පිරිසිදු පානීය ජලය බෙදා හැරීමට ඔහු සතුව පැවතියේ එක් වතුර බවුසරයක් පමනි.

අම්පාර දිස්ත්‍රික්කයේ රෝහල් 5කට අලාභහානි සිදු වී තිබිනි. දිස්ත්‍රික්කයේ විශාලතම අම්පාර මහ රෝහල රෝගීන්ගෙන් පිරී ඉතිරී තිබිනි. රෝහල් සේවකයන් අපට කීවේ තමන් හැකි ඉක්මනින් ආපසු වැඩට පැමිනි බවත් බොහොමයක් දෙනා 26 දින සවස වන විටත් රාජකාරියේ යෙදී සිටි බවත් ය. විපත් සිදු වූ දින උදෑසන පටන් ම එක දිගට දින තුනක් සමහරු සේවයෙහි නිරතව සිටියහ.

සෑම දෙනාම - වෛද්‍යවරු, හෙදියන්, කනිෂ්ට කාර්ය මන්ඩලය හා පරිපූරක වෛද්‍යවරු මෙන් ම පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු සපයන සනීපාරක්ෂක කම්කරුවන් ද - එහි සිටිය හ. කිසිවෙක් අමතර ගෙවීමක් පිලිබඳ විමසුවේ නැත. ඔවුහු ස්වෙච්ඡාවෙන් වැඩ කලහ. සමහරුන්ට තම පවුලේ සාමාජිකයින් අහිමිව තිබුනි. මෙම අත්‍යසාමාන්‍ය උත්සාහය නිසා ඇතුලත් කරනු ලැබීමෙන් පසුව මිය ගියේ රෝගීන් 5 දෙනෙක් පමනි.

ප්‍රදේශ ගනනාවකටම තවමත් ලඟාවිය නොහැකි ය. දෙසැම්බර් 31 දා සහනාධාර රැගත් ලොරියක් ද රැගෙන මීරිගම සිට පැමිනි ස්වෙච්ඡා ආධාරක කන්ඩායමක් සමග අපි අම්පාරේ සිට මඩකලපුව දිස්ත්‍රික්කයේ පෙරිය කල්ලර් දක්වා ගමන් කලෙමු. එම ප්‍රදේශයට සුනාමියෙන් දැඩි ලෙස හානි සිදුව තිබූ අතර දින 5ක් පුරා කිසිදු ආහාරයක් ලැබී නොතිබුනි. එහි

ලඟාවන සියලුම මාර්ග දැඩි ලෙස හානියට පත්ව තිබුනි.

ගෙන ගිය ආධාරවලින් බාගයක් පමන පෙරිය කල්ලාර් කඳවුරට බෙදා දුන් කන්ඩායම කල්ලාර් පාලම දක්වා ඉදිරියට පැමිනි නමුත් ඉන් එහා යා නොහැකි විය. ස්වෙච්ඡා සේවකයන්ට, කිලෝ මීටරයක් පමන, ආධාර මලු කර තබා ගෙන යාමට සිදු විය. කන්ඩායමේ එක් අයෙක් කෑගැසුවේ: ''මගේ පිටේ තබාගෙන සම්පූර්න හාල් මිටියක් ගෙන ගිය ප්‍රථම අවස්ථාව මෙය'' බව කියමිනි. අම්පාර රෝහලේ වෛද්‍යවරයෙක් සරනාගතයන් වෙත බඩු ගෙන යාම සඳහා මෝටර් බයිසිකලයක් භාවිතා කලේ ය.

කොට්ටායි කල්ලාරුහි දී නැවතත් අපට නැවතීමට සිදු විය. අපව දුටු ප්‍රදේශවාසීන් ජලයේ බැස අප වෙත පැමිනියේ දැඩි ලෙස අවශ්‍ය ආහාර පාන ලබා ගැනීම සඳහා ය.

ආපසු ඒමේදී පසුපසින් වැලිවල එරී තිබුනු ලොරියක් නිසා මාර්ගය අවහිර වී තිබුනි. පොලිස් කොමාන්ඩෝ භටයන්ගේ වාහන කන්ඩායමක් හමුවන තෙක් අපි වර්ෂාව මධ්‍යයේ පයින් පැමිනියෙමු. විවෘත වාහනවල අපව කරයිතිවූ වෙත ගෙන ආවේ ඔවුන් ය. එදින රාත්‍රියේ අපව අම්පාරට ගෙන ගොස් ඇරලීමට ඔවුන් ඉදිරිපත් වුව ද ගංවතුර නිසා මාර්ගය අවහිරව තිබුනු බැවින් අප රාත්‍රිය ගත කලේ එම කඳවුරේම ය. පසු දින ජලයට යටවී තිබුන සහ කොටස් ගසාගෙන ගිය මාර්ග ඔස්සේ අපි අම්පාරට පැමිනියෙමු.

අප එහි ගත කල දින තුන පැහැදිලිව අනාවරනය කලේ වර්තමාන සමාජ හා ආර්ථික පර්යායේ අධම අසමත්කම පමනක් නොවේ, වඩා හොඳ සමාජයක් ගොඩ නැගීම සඳහා සාමාන්‍ය වැඩ කරන ජනයාට ඇති සැඟවුනු හැකියාවන් ය.

© www.wsws.org